**දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ පොදු තරග විභාගය - 2021**

ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2237 දරන හා 2021.07.16 දිනැති *ගැසට්පත්‍රයේ* පළකරන ලද 2021.07.15 දිනැති **සිංහල භාෂා** නිවේදනයේ පහත සංශෝධන සිදුවිය යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

| *වගන්තිය* | *සංශෝධනය* |
|---|---|
| පූර්විකාව | දෙවැනි ඡේදයේ අවසාන වාක්‍ය පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අයදුම්පත් 2021 ජූලි 17 සිට **2021 අගෝස්තු 23 දින පැය 24:00** දක්වා යොමු කළ හැකි වේ. |
| 1 | පළමු වාක්‍යය පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"මෙම විභාගයේ පළමු (පොදු) කොටස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2021 සැප්තැම්බර් හෝ ඔක්තෝබර් මස** කොළඹ දී පමණක් පවත්වනු ඇත.'' |
| 6. (ආ) I | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2233/19 දරන හා 2021.06.22 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 05 වැනි සංශෝධනයට අනුව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා බඳවා ගැනීමට අදාළ වන වයස් සීමාව පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන දිනට (2021.07.16) වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර **අවුරුදු තිස්පහ (35)** ට නොවැඩි විය යුතුය.'' |

| *වගන්තිය* | *සංශෝධනය* |
|---|---|
| 6. (ආ) II | අනු අංක 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අධ්‍යාපන සුදුසුකම් යටතේ (iii) උපවගන්තියේ "ආයතනික අදියර II විභාගය'' යන්න "**ආයතනික අදියර විභාගය**'' ලෙස සංශෝධනය විය යුතුය. |
| 6. (ආ) III -<br>අනු අංක 2 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) හා සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) යන තනතුරු දෙකෙහිම අධ්‍යාපන සුදුසුකම්වල අංක IV පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"IV ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධියක්** සමඟ ඉහත කුමන හෝ විෂයයක පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 3 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුර හි අධ්‍යාපන සුදුසුකම්වලට පහත අංක II එකතුවිය යුතුය.<br>"II **ඉහත කුමන හෝ විෂයයක් ප්‍රධාන විෂයය වූ පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය**'' |
| 6. (ආ) III - අනු අංක 4 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ රස පරීක්ෂක තනතුරහි සුදුසුකම් පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"I. රසායන විද්‍යාව, **ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව** හෝ **රසායන තාක්ෂණය** යන විෂයයන්ගෙන් එක් විෂයයක පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය, හෝ<br>II. **ඉහත කුමන හෝ විෂයයක** විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ **ඉහත කුමන හෝ විෂයයක්** ප්‍රධාන විෂයයවූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමඟ ජෛවරසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යෝහාරික රසායන විද්‍යාව/ව්‍යෝහාරික විද්‍යව පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>"රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සැකකටයුතු ලේඛන පිළිබඳ සහකාර පරීක්ෂක තනතුරහි අංක III සුදුසුකම පහත පරිදි සංශෝධනය විය යුතුය.<br>"අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ විද්‍යා විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු පද්ධති යන විෂයයන්ගෙ න් එක් විෂයයක **පළමු හෝ දෙවැනි පන්තියේ** සාමාර්ථයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය, හෝ'' |
| 6. (ආ) III - අනු අංක 5 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරහි අධ්‍යාපන සුදුසුකම්වලට V උපවගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම හා පහත උපවගන්ති VII ඇතුළු කිරීම.<br><br>'' V ජෛවීය විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සාමාන්‍ය උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධිය සමග ඉහත IV හි සඳහන් විෂයයක පශ්චාත් උපාධිය හෝ**''<br><br>''VII **සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් ප්‍රධාන විෂයයන් වූ පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය**'' |
| 6. (ආ) III - අනු අංක 6 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර වන සංරක්ෂක තනතුරහි අධ්‍යාපන සුදුසුකම්වල II හා V උපවගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම.<br><br>''II පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී වන විද්‍යා **හෝ පාරිසරික විද්‍යා උපාධිය**''<br><br>''V ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධිය** සමග වන විද්‍යා, උද්භිද විද්‍යා, ජීව විද්‍යා, කෘෂිකර්ම, පරිසර විද්‍යා හෝ වැවිලි කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 9 | උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි අංක IV සුදුසුකම පහත පරිදි සංශෝධනය විය යුතුය.<br><br>''IV ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හෝ **කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී සිව් අවුරුදු උපාධියක්** සමග ඉහත කුමන හෝ විෂයයක පශ්චාත් උපාධියක් ලබා තිබීම'' |
| 6. (ආ) III - අනු අංක 10 | සෞඛ්‍ය අමාත්‍යාංශයේ පර්යේෂණ නිලධාරි (කීට විද්‍යා) සහ කීට විද්‍යාඥ තනතුරු සඳහා වූ අධ්‍යාපන සුදුසුකම්වල I උප වගන්තියේ ''කීට විද්‍යාව විෂයක් වශයෙන්'' යන්න ''**කීට විද්‍යාව විශේෂිත විෂයක වශයෙන්**'' ලෙස නිවැරදි විය යුතුය. |

2. අයදුම්පත් භාරගැනීම 2021 අගෝස්තු 23 දින පැය 24:00 දක්වා සිදුවනු ඇත.

3. මුල් නිවේදනයට අනුව 2021 ජූලි 31 දින දක්වා අයදුම්පත් සඳහා විභාග ගාස්තු ගෙවා ඇති කිසියම් අයදුම්කරුවකුට තමන් විසින් සේවාවලට/ සේවාවක තනතුරුවලට ලබා දී ඇති මනාප අනුපිළිවෙල මෙම සංශෝධනය අනුව වෙනස් කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකර ඇති www.doenets.lk/downloads දිගුව හරහා මනාප සංශෝධනය කිරීමේ අයදුම්පත බාගතකර, නිසි පරිදි සම්පූර්ණකර අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හා slexamcomp@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමුකළ යුතුය.. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ“දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2021 - මනාප සංශෝධනය” යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

සටහන : මනාප සංශෝධනය කිරීමේ අයදුම්පතේ මුද්‍රිත පිටපත ලියාපදිංචි තැපැල් මගින් එවීම අනිවාර්යවේ. මුද්‍රිත පිටපත තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. මනාප සංශෝධනය කිරීමේ අයදුම්පත විද්‍යුත් ලිපිනයෙන් ඉදිරිපත් කර තිබුණද, එහි මුද්‍රිත පිටපත නියමිත දිනට විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත්ව නොමැති අවස්ථාවකදී, මුල් අයදුම්පතහි මනාප අනුපිළිවෙල තවදුරටත් වලංගු ලෙස සලකා කටයුතු කරනු ඇත.

4. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් වැඩකරන දිනවල කාර්යාලයීය වේලාව තුළදී දුරකතන අංක 011 2136607 අමතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පත්වීම්) වෙතින් විමසීමක් කළ හැකිය.

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.